(x1)

කාර්යාල නියෝග 10/2021

මගේ අංකය: RG/AB/01/චක්‍රලේඛ හාකාර්යාල නියෝග
පාලන අංශය,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
බත්තරමුල්ල.
2021-04-28 වෙනි දින.

ප්‍රධාන කාර්යාලයේ සියලුම අංශ භාර මාණ්ඩලික නිලධාරීන්
මධ්‍යම ලේඛණාගාරය/ කලාප භාර නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන්
දිස්ත්‍රික් භාර සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන්
ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන්

<u>රාජ්‍ය සේවය බාධාවකින් තොරව පවත්වාගෙන යාම</u>

රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කරන ලද අංක: 02/2021 (1) හා 2021-04-27 දිනැතිත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා බැඳේ.

02. කොවිඩ් 19 වෛරස් ව්‍යාප්තිය වැළැක්වීම සඳහා සෞඛ්‍ය අංශ විසින් නිකුත් කර ඇති උපදෙස් මාලාව සැලකිල්ලට ගෙන 2021-03-05 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2021 හි විධිවිධාන නැවත දැනුම් දෙන තුරු තාවකාලිකව අත්හිටුවනු ලැබ ඇත.

03. ඒ අනුව, 2021-04-28 දින සිට කාර්ය මණ්ඩලයේ නිලධරයන්ට, ලිත් මසකට උපරිම වැඩ කරන දින 08ක් වනසේ සතියකට වැඩ කරන දින 02ක් නිලධරයන්ගේ නිවාඩුවලින් අඩු නොකර සේවයට වාර්තා නොකර සිටීමට ඉඩ දිය හැකි වන අතර, මෙම නියෝගය අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් ඇතුළුව මාණ්ඩලික නිලධාරීන් සඳහා අදාළ නොවන බව ද වැඩිදුරටත් සඳහන් කරමි.

04 ඉහත පරිදි එක් ලිත් මසක් තුළ නිලධරයෙකුට ඔහුට හිමි ඔහුගේ සාමාන්‍ය නිවාඩු ලබා නොගෙන සේවයට වාර්තා නොකිරීමට ඉඩදිය හැකි උපරිම දින ගණන දින 08ක් ඉක්මවා නොයන පරිදි තම ආයතනයට වඩාත් ගැලපෙන පරිදි සේවයට වාර්තා කිරීමේ ක්‍රමවේදය සකස් කර ඉදිරිපත් කල යුතුය.

05. දෛනික ජන ජීවිතය යථා පරිදි පවත්වා ගැනීමට අවශ්‍ය සේවා සැපයුම බාධාවකින් තොරව පවත්වා ගෙන යාම සඳහා නිලධරයන් දින 03කට වඩා සේවයට කැඳවීමේ අවශ්‍යතාවයක් පවතීනම් ඒ අනුව නිලධරයන් කැඳවීම සම්බන්ධයෙන් තීරණයක් ගතහැකි වන අතර, එලෙස මාසික මුර සැකසීමෙන් පසු නිලධරයෙකු සේවා මුර ක්‍රමය අනුව සේවයට වාර්තා කළ යුතු දිනයක සේවයට වාර්තා නොකළේ නම් පමණක් එම දිනය ඔහුගේ පෞද්ගලික නිවාඩුවලින් අඩු කිරීමට කටයුතු කළ යුතු ය.

06. සේවා මුර ක්‍රමයට අනුව සේවයට නොකැඳවූ දිනයක දී වුව ද සෑම රජයේ නිලධරයෙකුම මාර්ගගත ක්‍රමය ඔස්සේ ස්වකීය රාජකාරියට අදාළ කාර්යයන්හි යෙදීමට සූදානම්ව සිටිය යුතු ය.

07. වෛද්‍ය හෝ වෙනත් හේතූන් මත මෙම සේවා මුර ක්‍රමයට ඇතුළත් කර නොගන්නා නිලධරයන්ගේ නිවාඩු සම්බන්ධයෙන් සාමාන්‍ය පරිදි කටයුතු කළ යුතු ය.

08. මෙලෙස සේවා මුර ක්‍රමයක් හඳුන්වා දීමේ අරමුණ සේවා ස්ථානයන්හි පුද්ගල දුරස්ථභාවය ආරක්ෂා කර ගැනීම හා වෛරසය පැතිරීම අවම කිරීම වන බැවින්, එම අරමුණ මුල් තැන්හි තබා කටයුතු කළ යුතු අතර, නිලධරයන්ගේ පහසුව හෝ කැමැත්ත ඉන් පසුව සැලකිල්ලට ගත යුතු ය.

09. යම් රජයේ නිලධරයකු පවතින තත්ත්වය තුළ නිරෝධායන රෙගුලාසි යටතේ නිරෝධායනයට යොමුකර ඇත්නම් හා එසේ නිරෝධායනය සඳහා යොමුකර ඇත්තේ රජයේ නිරෝධායන නීතිරීති උල්ලංඝනය කිරීම වෙනුවෙන් වන දඬුවමක් ලෙස නොවන්නේ නම් එවැනි නිලධරයන් සඳහා එම

නිරෝධායන කාල සීමාව ආයතන සංග්‍රහයේ xii වැනි පරිච්ඡේදයේ 12.9 උප වගන්තියෙහි විධිවිධාන පරිදි සම්පූර්ණ වැටුප් සහිත කාල සීමාවක් ලෙස සැලකිය යුතු ය.

10. කොවිඩ් 19 ව්‍යාප්තිය වැළැක්වීම සඳහා රජය විසින් දැනටමත් නිකුත් කර ඇති සෞඛ්‍ය උපදෙස් සහ ඉදිරියේ දී නිකුත් කරනු ලබන සෞඛ්‍ය උපදෙස් අනුව තම කාර්යාලයේ නිලධරයන් සේවයේ යෙදවීම සම්බන්ධයෙන් ඔබගේ පෞද්ගලික අවධානය යොමුකර කටයුතු කළ යුතු අතර, එක්දින සේවා කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යායුතු බව ද කාරුණිකව දන්වා සිටිමි.

ඩබ්.එම්.එම්.බී.වීරසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්

ඩබ්.එම්.එම්.බී.වීරසේකර
රෙජිස්ට්‍රාර් ජනරාල්
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
නො.234/ඒ 3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
කොස්වත්ත, බත්තරමුල්ල.